ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ මානව සම්පත් දෙපාර්තමේන්තුව

දිනය 2017.08.21

## නව නියෝජ්‍ය අධිපතිවරයෙකු පත් කිරීම



මුදල් මණ්ඩලය විසින් ගරු මුදල් අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති සී. ජේ. පී. සිරිවර්ධන මහතා **2017** අගෝස්තු මස **19** වැනි දින සිට නියෝජ්‍ය අධිපති තනතුර සඳහා පත්කර ඇත.

## සී. ජේ. පී. සිරිවර්ධන මහතා

සී. ජේ. පී. සිරිවර්ධන මහතා මහ බැංකුවෙහි වසර **31** කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අතර, ආර්ථික හා මිල ස්ථායීතාව, මූල්‍ය පද්ධති ස්ථායීතාව සහ අනෙකුත් නියෝජිත කාර්යයන් පිළිබඳව විශේෂ පළපුරුද්දක් දරයි. සිරිවර්ධන මහතා නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස පත් වීමට පෙර රාජ්‍ය ණය, තොරතුරු තාක්ෂණ, නීති හා අනුකූලතා, සාර්ව විචක්ෂණතා අධ්‍යයන, මානව සම්පත්, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ, ගෙවීම් හා පියවීම්, සහ අවදානම් කළමනාකරණ යන දෙපාර්තමේන්තු භාර සහකාර අධිපතිවරයා විය.

සිරිවර්ධන මහතා එක්සත් රාජධානියේ වෝරික් විශ්ව විද්‍යාලයෙන් (**University of Warwick**) ප්‍රමාණාත්මක සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද රුහුණ විශ්ව විද්‍යාලයෙන් කෘෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද ලබා

ගෙන ඇත. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලේකම් ලෙස ද කටයුතු කර ඇත. ඒ මහතා මේ වන විට ලංකාක්ලියර් පෞද්ගලික සමාගමේ සහ සීමාසහිත කොළඹ නැව් තටාකාංගන සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි. සිරිවර්ධන මහතා ලංකා විදුලිබල මණ්ඩලය, ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා ලිමිටඩ් සහ කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂකයෙකු ලෙස ද කටයුතු කර ඇත. තවද, සිරිවර්ධන මහතා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් විවිධ ජාතික සහ ජාත්‍යන්තර සමුළු රැසකට සහභාගි වී ඇත. තම දිගු කාලීන මහ බැංකු සේවා කාලය තුළ ඒ මහතා අවදානම් කළමනාකරණය, ණය කළමනාකරණය, ආයෝජන කළමනාකරණය, මූල්‍ය ස්ථායිතාවය, මුදල් ප්‍රතිපත්තිය, නායකත්වය සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් රැසකට සහභාගි වී ඇත. විශේෂයෙන්ම ණය කළමනාකරණය සහ ආයෝජන යන ක්ෂේත්‍රයන්හි තත්ත්වය වැඩි දියුණු කිරීම වෙනුවෙන් සිරිවර්ධන මහතා විසින් නව හඳුන්වාදීම් සිදු කර ඇති අතර සුවිශේෂී දායකත්වයක් සපයා ඇත. මුදල් ප්‍රතිපත්ති කමිටුව (**MPC**), මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව (**FSSC**), අන්තර් නියාමන ආයතන කමිටුව (**IRIC**) සහ මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (**NFRMC**) යනාදියෙහි සාමාජිකයෙකු ලෙස සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විශාල දායකත්වයක් සපයා ඇත.

සිරිවර්ධන මහතා පිළිගත් දේශීය සහ ජාත්‍යන්තර සඟරා සඳහා රාජ්‍ය මූල්‍ය, ණය කළමනාකරණය සහ බැඳුම්කර වෙළඳපොළ සංවර්ධනය පිළිබඳව ලිපි රැසක් ලියා පළ කර ඇත. ඒ මහතා විවිධ තරාතිරමේ සමුළුවල නිත්‍ය දේශකයෙකු ලෙස කටයුතු කරන අතර මැලේසියාවේ අග්නිදිග ආසියාතික මහ බැංකු පර්යේෂණ සහ පුහුණු කේන්ද්‍රයෙහි (**SEACEN Research and Training Centre**) පීඨ සභිකයෙකු ලෙස ද කටයුතු කර ඇත.